# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 42 දරන
# ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අගෝස්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 42 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 73/90

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1992 අංක 42 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 8 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ "දිරිගැන්වීම ; හා" යන වචන වෙනුවට "දිරි ගැන්වීම", යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ "පවත්වාගෙන යාම හා කළමනාකරණය" යන වචන වෙනුවට, "පවත්වාගෙන යාම හා කළමනාකරණය ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(උ) ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීම උදෙසා දිවි පුදන ලද හමුදා භටයන් සදානුස්මරණය කිරීම.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, නිලධරයන්ගේ, මහා සභාවේ සහ විධායක කොමිටියේ සාමාජිකයන්ගේ කාර්ය ඉටු කිරීම සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා, සංස්ථාව විසින් මහා සභාවේ වාර්ෂික මහා සභා රැස්වීමකට හෝ විශේෂ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකිය.". සහ

2 1992 අංක 42 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය (සංශෝධන) පනත

(ආ) ඒ වගන්තියේ (2) උපවගන්තියේ "සංස්ථාවේ මහා සභා රැස්වීමකදී" යන වචන වෙනුවට "මහා සභාවේ වාර්ෂික මහා රැස්වීමකදී හෝ විශේෂ රැස්වීමකදී" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ දැක්වෙන 27 වන රීතිය ඉවත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූල තාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1 160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.